ලංසු කැඳවීම

ලංකා විදුලිබල මණ්ඩලය

ලංසු අංකය - PSRSP/PM2/Tenders/2022/04

මාසික කුලී පදනම මත නිවසක් ලබා ගැනීම - හම්බන්තොට නාගරික ප්‍රදේශය

බලශක්ති පද්ධති විශ්වසනීයව සවිබලගැන්වීමේ ව්‍යාපෘතියේ සේවක නවාතැන්පලක් සඳහා හම්බන්තොට ප්‍රදේශයෙන් කුලී පදනම මත නිවසක් වසරක කාල සීමාවකට ලබා ගැනීමට අවශ්‍යව ඇත. ඒ සඳහා පහත පහසුකම් සහිත නිවසක් සැපයීම වෙනුවෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

අදාල නිවස හම්බන්තොට නගර මධ්‍යයේ සිට අරය 5 km ක වපසරියක පිහිටා තිබිය යුතු අතර පහත සඳහන් කරුණු වලින් සමන්විත විය යුතුය.

1. නිවසේ භූමි ප්‍රමාණය අවම වශයෙන් ව.අ. 2000 ක් විය යුතුය
2. නිවසේ සාලයක් හා නිදන කාමර 2ක් අවම වශයෙන් තිබිය යුතු අතර එම නිවස අවම ශයෙන් පහත දක්වා ඇති ගෘහ භාණ්ඩ වලින් සමන්විත විය යුතුය.
   a. එක් එක් නිදන කාමර සඳහා තනි පුද්ගල ඇඳවල් 2ක්, අල්මාරියක්, මේසයක් හා පුටු දෙකක් තිබිය යුතුය.
   b. සාලය සඳහා ඇදි පුටු 6ක් හා ටී පෝවක් තිබිය යුතුය.
3. නිවස තුල නාන කාමර පහසුකම් තිබිය යුතුය.
4. ජලය සහ විදුලිය පහසුකම් තිබිය යුතුය (ජලය හා විදුලිය බිල්පත් ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ගෙවීම් සිදුකරනු ලැබේ)
5. වාහන 02ක් ගාල් කිරීමට පහසුකම් තිබිය යුතු අතර පිවිසීමේ මාගර්ය අවම වශයෙන් අඩි 15 විය යුතුය.

මුද්‍රා තබන ලද ලංසු 2022-06-23 දින පෙ.ව. 10.00 දක්වා භාර ගනු ලැබේ. ලංසු භාරගැනීමේ අවසන් වේලාව පසු වූ වහාම ලංසු විවෘත කරනු ඇත. ලංසුකරු හෝ ඔහු විසින් බලය පවරා ඇති නියෝජිතයකුට ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගි විය හැක.

ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ කායර්ාලයට ගෙනැවිත් භාරදීම සිදු කල හැකිය.

ව්‍යාපෘති අධ්‍යක්ෂ
බලශක්ති පද්ධති විශ්වසනීයව සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය ,
ලංකා විදුලිබල මණ්ඩලය,
අංක .759
තලංගම දකුණ,
පැලවත්ත.

පහත දක්වා ඇති සියලු විස්තර තමා විසින් පිළියෙල කර ගත් ලංසුවේ ඇතුලත් කල යුතු අතර, කවරය වම් පස උඩ කෙළවරේ "මාසික කුලී පදනම මත නිවසක් ලබා ගැනීම - හම්බන්තොට ප්‍රදේශය, ලංසු අංක: PSRSP/PM2/Tenders/2022/04" යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.

1. කුලියට ලබා දෙනු ලබන නිවසේ අයිතිකරුගේ නම, ලිපිනය සහ දුරකථන අංකය
2. කුලියට ලබා දෙනු ලබන නිවසේ අයිතිකරුගේ ජාතික හැඳුනුම් පතේ පිටපතක්
3. කුලියට ලබා දෙනු ලබන නිවස පිහිටි ස්ථානයේ ලිපිනය
4. නිවස පිහිටි ඉඩමෙහි ඔප්පුවේ පිටපතක්
5. ඉහත සඳහන් පහසුකම් පිලිබඳ විස්තර
6. අපේක්ෂිත මාසික කුලිය
7. ප්‍රධාන මාගර්යේ සිට නිවසට පිවිසෙන මාගර්ය දැක්වෙන දළ රූප සටහනක්

අයිතිකරුවන් පමණක් අයදුම් කරන්න.

මේ පිළිබඳව දැනගැනීමට අවශ්‍ය වෙනත් අමතර විස්තර ඇතොත් සතියේ රාජකාරි කෙරෙන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලයේදී ව්‍යාපෘති අධ්‍යක්ෂ බලශක්ති පද්ධති විශ්වසනීයව සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය වෙතින් අංක 0112888495/96 දරන දුරකථනය ඔස්සේ දැනගත හැක.

අතිරේක සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති)
ලංකා විදුලිබල මණ්ඩලය

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD